රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 172

මගේ අංකය:- ව්‍යස. 27 (ප්‍රති) (IV) (II).

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1980 ජූලි මස 29 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙත.

## 1980 ජූලි වැඩ වර්ජනය – වෘත්තීය සමිතිවලට දෙන ලද "පහසුකම්" ඉවත්කිරීම

ඇතැම් සේවකයින් විසින් මෑතදී කර ඇති වැඩ වර්ජනය හේතුවෙන් පහත දැක්වෙන ක්‍රියා මාර්ග වහාම ගැනීමට තීරණය කර ඇත.

(I) පූර්ණකාලීනව වෘත්තීය සමිති කටයුතුවල නිරතවීම සඳහා මුදාහැර ඇති, වැඩ වර්ජනයට සහභාගිවී සිටින සියළුම වෘත්තීය සමිති සාමාජිකයින්ට තම සාමාන්‍ය රාජකාරිවලට අදාළ තනතුරුවල වැඩට වාර්තා කරන ලෙස උපදෙස් දිය යුතුය. මෙම නිලධාරීන් ඔවුන් මුදාහරින අවස්ථාවේ සේවයේ යෙදී සිටි ආයතනවල ප්‍රධානීන් වෙත සේවයට වාර්තා කළ යුතුය.

(II) නිල වාහන පාවිච්චිකිරීම; නිදහස් ගමන් බලපත්‍ර වැනි, පූර්ණකාල වෘත්තීය සමිති වැඩ සඳහා සලසා ඇති පහසුකම් ඉහත සඳහන් නිලධාරි කොට්ඨාශයෙන් ඉවත් කළ යුතුය.

(III) අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථා භූමිවල පිහිටුවා ඇති, වැඩ වර්ජනයට සහභාගිවී ඇති සාමාජිකයින් සිටින වෘත්තීය සමිතිවලට අයත් කාර්යාල වහා දමා සීල් තැබිය යුතුය.

වැඩබලන ලේකම්.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.